# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2341/27 - 2023 ජූලි මස 19 වැනි බදාදා - 2023.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 33/1973 (III)

### ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනතේ 8 වන සහ 29 වන වගන්ති සමග කියවිය යුතු, 82අ වන වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ආචාර්ය **විජයදාස රාජපක්ෂ,**  
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම  
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 ජූලි මස 17 වැනි දින,  
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග බෙදුම් නඩු (මැනීම සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති ගාස්තු ප්‍රමාණ, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත ප්‍රකාරව, බෙදුම් නඩුවක මුල් මැනීමේ ගාස්තුව ඇස්තමේන්තු කිරීමට අදාළ වන ගාස්තු ප්‍රමාණ විය යුතු ය.

3. මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති ගාස්තු ප්‍රමාණ, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත ප්‍රකාරව, අවසාන වශයෙන් බෙදා වෙන් කිරීම සඳහා මැනීමේ ගාස්තුව නිශ්චය කිරීමට අදාළ වන ගාස්තු ප්‍රමාණ විය යුතු ය.

4. 2014 ජූලි මස 18 වැනි දින අංක 1871/42 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2014 අංක දරන බෙදුම් නඩු (මැනීම් සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණ) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

1 වන උපලේඛනය

(2 වන නියෝගය)

*මුල් මැනීම සඳහා අදාළ වන ගාස්තු ප්‍රමාණ*

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *මුල් මැනීමට අදාළව සිදු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර* | *අදාළ ගාස්තු ප්‍රමාණ* |
| 1. ලියාපදිංචි තැපැල මගින් පාර්ශවකරුවන් වෙත දැන්වීම් නිකුත් කිරීම | ලිපියක් ලියාපදිංචි කිරීම සඳහා අයකරනු ලබන ගාස්තුව සහ දැන්වීමකට රු. 40/-ක්. |
| 2. වාචික ප්‍රකාශනයක් සිදු කරනු ලබන තැනැත්තකුට ගෙවිය යුතු වේතන සහ ගමන් වියදම් | රු. 3,000/-ක් සහ අදාළ ස්ථානයට ගමන් කිරීම සඳහා සහා එම ස්ථානයේ සිට ආපසු පැමිණීම සඳහා වන බස් ගාස්තු |
| 3. යම් ඉඩමක් සම්බන්ධයෙන් මැනීමක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක, එම ඉඩම - | |
| (අ) (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහ නගර සභා සීමාවක් තුළ පිහිටා ඇත්නම්; | වර්ග මීටර් 250 දක්වා රු. 20,000ක් සහ එක් එක් අතිරේක වර්ග මීටර් 100 සඳහා රු. 2,000ක් |
| (ආ) (i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශයක සීමාව තුළ පිහිටා ඇත්නම්,<br>(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ආයෝජන මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් බල ප්‍රදේශයක හෝ යම් බලපත්‍රලත් කලාපයක් තුළ පිහිටා ඇත්නම්.<br>(iii) (255 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නගර සභාවක සීමා තුළ පිහිටා ඇත්නම්; | වර්ග මීටර් 250 දක්වා රු. 15,000ක් සහ එක් එක් අතිරේක වර්ග මීටර් 500 සඳහා රු. 2,000ක් |
| (ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය සභාවක සීමා තුළ පිහිටා ඇත්නම් ;<br>(ඉහත සඳහන් මැනීම සඳහා, පිඹුර සහ වාර්තාව සකස් කිරීම, අනුපිටපත් ලබාදීම, පිඹුර අධිෂ්ඨාපනය කිරීම මගින් බිම් කැබලි පෙන්නුම් කිරීම සහ පිඹුරේ සංවර්ධනය පෙන්නුම් කිරීම ඇතුළත් වේ.) | වර්ග මීටර් 250 දක්වා රු. 12,000/-ක් සහ එක් එක් අතිරේක වර්ග මීටර් 250 සඳහා රු. 1,500/- ක් |

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *මුල් මැනීමට අදාළව සිදු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර* | *අදාළ ගාස්තු ප්‍රමාණ* |
| 4. සහයකයනගේ වේතන -<br>(*අ*) පුහුණු සහයකයකු සඳහා<br>(*ආ*) එක් එක් නුපුහුණු සහයකයකු සඳහා<br>එසේ වුව ද, පුහුණු සහායකයන්ද ඇතුළුව සහායකයන් සංඛ්‍යාව පස්දෙනෙකු නොඉක්මවිය යුතු ය. | –<br>රු. 3,500/-<br>රු. 3,000/- |
| 5. මිනින්දෝරුවරයාගේ පාලනයට පරිබාහිර තත්ත්වයන් හේතුවෙන් එක් දිනයක් තුළ මැනීම් කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වන අවස්ථාවක, අදාළ දිනය සඳහා පහත දැක්වෙන ගාස්තු ප්‍රමාණ අයකරනු ලැබිය හැකි ය.<br>(*අ*) මිනින්දෝරුවරයා සඳහා වන වෘත්තීය ගාස්තුව<br>(*ආ*) පුහුණු සහයකයකු සඳහා<br>(*ඇ*) එක් එක් නුපුහුණු සහයකයකු සඳහා<br>එසේ වුව ද, පුහුණු සහයකයන් ද ඇතුළුව සහායකයන් සංඛ්‍යාව පස්දෙනෙකු නොඉක්මවිය යුතු ය. | රු. 7,500/-<br>රු. 3,500/-<br>රු. 3,000/- |
| 6. මිනින්දෝරුවරයා සඳහා වන වෘත්තීය ගාස්තු | සාක්ෂි ලබාදීම ඇතුළුව සියලු කාර්ය සඳහා සහභාගීවීම වෙනුවෙන් එක් දිනකට රු. 10,000/- |
| 7. මැනීමක් සඳහා වන අවම තැන්පතුව | වර්ග මීටර් 2,000 දක්වා රු. 20,000/- සහ එක් එක් අතිරේක වර්ග මීටර් 1,000 සඳහා රු. 3,500/- |
| 8. 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද වැල්ලවත්ත, කිරුළපන සහ දෙහිවල යන ප්‍රදේශවල කැඩැස්තර සිතියම් සකස් කිරීම සඳහා | පිළිවෙලින් අයිතම 1 සිට 5 දක්වා වූ අයිතම්වල සඳහන් ගෙවීමට අමතරව, 60%ක අතිරේක ගෙවීමක්. |
| 9. යම් අවහිර කිරීමක් හෝ බාධා පැමිණීමක් හේතුවෙන් මිනින්දෝරුවරයාට මැනීම් කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වන අවස්ථාවක, පහත දැක්වෙන ගාස්තු ප්‍රමාණ අයකරනු ලැබිය හැකි යඃ-<br>(*අ*) මිනින්දෝරුවරයා සඳහා වන ගාස්තු<br>(*ආ*) පුහුණු සහයකයකු සඳහා<br>(*ඇ*) එක් එක් නුපුහුණු සහයකයකු සඳහා<br>එසේ වුව ද, පුහුණු සහායකයන් ද ඇතුළුව සහායකයන් සංඛ්‍යාව හත්දෙනෙකු නොඉක්මවිය යුතු ය. | රු. 10,000/-<br>රු. 3,500/-<br>රු. 3,000/- |
| 10. අධිකරණයේ සිට දුර ගණනය කරනු ලැබිය යුතු, මැනීම සිදු කළ යුතු ඉඩමට ගමන් කිරීම සඳහා | ආයතන සංග්‍රහයට අනුකූලව රාජ්‍ය නිලධරයන්ට ගෙවනු ලබන ගාස්තු ප්‍රමාණ |
| 11. වෙනත් යම් පිඹුරු අධිස්ථාපනය කිරීම | පළමු බිම් කැබලි 10 සඳහා රු. 5,000/-ක් සහ එක් එක් අතිරේක බිම් කැබැල්ලක් සඳහා රු. 250/-ක් |

II වන උපලේඛනය

(3 වන නියෝගය)

*අවසාන මැනීම සඳහා අදාළ වන ගාස්තු ප්‍රමාණ*

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *අවසාන මැනීමට අදාළව සිදු කරන ලද කාර්යය පිළිබඳ විස්තර* | *අදාළ ගාස්තු ප්‍රමාණ* |
| 1. ලියාපදිංචි තැපැල මගින් පාර්ශවකරුවන් වෙත දැන්වීම් නිකුත් කිරීම | ලිපියක් ලියාපදිංචි කිරීම සඳහා අයකරනු ලබන ගාස්තුව සහ දැන්වීමකට රු. 40/-ක්. |
| 2. වාචික ප්‍රකාශනයක් සිදු කරනු ලබන තැනැත්තෙකුට ගෙවිය යුතු වේතන සහ ගමන් වියදම් | රු. 3,000/-ක් සහ අදාළ ස්ථානයට ගමන් කිරීම සඳහා සහ එම ස්ථානයේ සිට ආපසු පැමිණීම සඳහා වන බස් ගාස්තු |
| 3. යම් ඉඩමක් සම්බන්ධයෙන් මැනීමක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක, එම ඉඩම -<br><br>(අ) (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහ නගර සභා සීමාවක් තුළ පිහිටා ඇත්නම්; | වර්ග මීටර් 250 දක්වා රු. 20,000ක් සහ එක් එක් අතිරේක වර්ග මීටර් 100 සඳහා රු. 2,000ක් |
| (ආ) (i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශයක සීමාව තුළ පිහිටා ඇත්නම්,<br><br>(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ආයෝජන මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් බල ප්‍රදේශයක හෝ යම් බලපත්‍රලත් කලාපයක් තුළ පිහිටා ඇත්නම්.<br><br>(iii) (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නගර සභා සීමා තුළ පිහිටා ඇත්නම්; | වර්ග මීටර් 250 දක්වා රු. 15,000ක් සහ එක් එක් අතිරේක වර්ග මීටර් 500 සඳහා රු. 2,000ක |
| (ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය සභාවක සීමා තුළ පිහිටා ඇත්නම් ;<br><br>(ඉහත සඳහන් මැනීම සඳහා, පිඹුර සහ වාර්තාව සකස් කිරීම, අනුපිටපත් ලබාදීම, පිඹුර අධිෂ්ඨාපනය කිරීම මගින් බිම් කැබලි පෙන්නුම් කිරීම සහ පිඹුරේ සංවර්ධනය පෙන්නුම් කිරීම ඇතුළත් වේ.) | වර්ග මීටර් 250 දක්වා රු. 12,000ක් සහ එක් එක් අතිරේක වර්ග මීටර් 250 සඳහා රු. 1,500ක |

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *අවසාන මැනීමට අදාළව සිදු කරන ලද කාර්යය පිළිබඳ විස්තර* | *අදාළ ගාස්තු ප්‍රමාණ* |
| 4. සහයකයන්ගේ වේතන - | |
| (*අ*) පුහුණු සහයකයකු සඳහා | රු. 3,500/- |
| (*ආ*) එක් එක් නුපුහුණු සහයකයකු සඳහා | රු. 3,000/- |
| එසේ වුව ද, පුහුණු සහයකන්ද ද ඇතුළුව සහයකයන් සංඛ්‍යාව පස්දෙනෙකු නොඉක්මවිය යුතු ය. | |
| 5. මිනින්දෝරුවරයාගේ පාලනයට පරිබාහිර තත්ත්වයන් හේතුවෙන් එක් දිනයක් තුළ මැනීම් කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වන අවස්ථාවක, අදාළ දිනය සඳහා පහත දැක්වෙන ගාස්තු අයකරනු ලැබිය හැකි ය. | |
| (*අ*) මිනින්දෝරුවරයා සඳහා වන වෘත්තීය ගාස්තුව | රු. 7,500/- |
| (*ආ*) පුහුණු සහයකයකු සඳහා | රු. 3,500/- |
| (*ඇ*) එක් එක් නුපුහුණු සහයකයකු සඳහා | රු. 3,000/- |
| එසේ වුව ද, පුහුණු සහයකයන්ද ද ඇතුළුව සහයකයන් සංඛ්‍යාව පස්දෙනෙකු නොඉක්මවිය යුතු ය. | |
| 6. මිනින්දෝරුවරයා සඳහා වන වෘත්තීය ගාස්තු | සාක්ෂි ලබාදීම ඇතුළුව සියලු කාර්ය සඳහා සහභාගීවීම වෙනුවෙන් එක් දිනකට රු. 10,000/- |
| 7. මැනීම් කටයුතු පවත්වාගෙන යාම සඳහා - | |
| (*අ*) මුල් මැනීමේ සිට වසරක කාලසීමාවක් ඇතුළත මුල් මැනීම සිදු කරන ලද මිනින්දෝරුවරයාටම අධිකාර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්නම් | මුල් මැනීම සිදු කිරීම සඳහා ගෙවනු ලැබිම යුතු ගාස්තුවෙන් හරි අඩක් (1/2) |
| (*ආ*) මුල් මැනීමේ සිට වසරක කාලසීමාවකින් පසුව මුල් මැනීම සිදු කරන ලද මිනින්දෝරුවරයාටම අධිකාර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්නම් | මුල් මැනීම සිදු කිරීම සඳහා ගෙවනු ලැබිය යුතු ගාස්තුවෙන් හතරෙන් තුනක් (3/4) |
| (*ඇ*) වෙනත් මිනින්දෝරුවරයකුට අධිකාර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්නම්, කාලය නොසලකමින්, | මුල් මැනීම සිදු කිරීම සඳහා ගෙවනු ලැබිය යුතු ගාස්තුව |
| 8. (*අ*) කැබලි වෙන් කිරීමේ සැකැස්ම සකස් කිරීම - | පළමු කැබලි 10 සඳහා රු. 6,000ක් සහ එක් එක් අතිරේක කැබැල්ල සඳහා රු. 500 |
| (*ආ*) බිමෙහි කැබලි වෙන් කිරීම් සටහන් කිරීම - | |
| (i) වර්ග මීටර් 500ක් දක්වා වූ බිම් කැබැල්ලක් සඳහා | රු. 2,000/- |
| (ii) වර්ග මීටර් 1,000ක් දක්වා වූ බිම් කැබැල්ලක් සඳහා | රු. 2,500/- |
| (iii) වර්ග මීටර් 2,000ක් දක්වා වූ බිම් කැබැල්ලක් සඳහා | රු. 3,000/- |
| (iv) වර්ග මීටර් 4,000ක් දක්වා වූ බිම් කැබැල්ලක් සඳහා | රු. 4,000/- |
| (v) වර්ග මීටර් 4,000ක් වැඩි බිම් කැබැල්ලක් සඳහා | රු. 5,000/- |

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *අවසාන මැනීමට අදාළව සිදු කරන ලද කාර්යය පිළිබඳ විස්තර* | *අදාළ ගාස්තු ප්‍රමාණ* |
| 9. වන්දි ගෙවීමේ හෝ සම කිරීමේ කාර්යය සඳහා භූමියේ, වැව්ලිවල හා ගොඩනැගිලිවල සහ අනෙකුත් ඉදිකිරීම්වල සහ වැඩි දියුණු කිරීම්වල වටිනාකම තක්සේරු කිරීමේ ගාස්තු : | |
| (i) 1 වන තලය සඳහා | රු. 50,000/- 1% - රු. 500/- |
| (ii) 2 වන තලය සඳහා | රු. 50,000/- 3/4% - රු. 375/- |
| (iii) 3 වන තලය සඳහා | රු. 50,000/- 1/2% - රු. 250/- |
| (iv) 4 වන තලය සඳහා | රු. 50,000/- 1/4% - රු. 125/-<br>රු. 200,000 - - රු.1,250/- |
| (v) රු. 200,000 කට වඩා වැඩි නම් | ඇගයීමෙන් 1/8% |
| 10. ඇගයීම් උපලේඛනය සහ බෙදාදීම පිළිබඳ සාරාංශය සකස් කිරීම | පළමු බිම් කැබලි හතර සඳහා රු. 250/ක් සහ අතිරේක බිම් කැබැල්ලක් සඳහා රු. 300/- ක් |
| 11. අධිකරණයේ සිට දුර ගණනය කරනු ලැබිය යුතු, මැනීම සිදු කළ යුතු ඉඩමට ගමන් කිරීම සඳහා | ආයතන සංග්‍රහයට අනුකූලව රාජ්‍ය නිලධරයන්ට ගෙවනු ලබන ගාස්තු ප්‍රමාණ |

EOG 07 - 0179

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.